2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම: සීමාසහිත (ජනතා) කහම්බාන ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3138
3. සංස්ථාගත කළ දිනය : 2007.07.12
4 ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : කහම්බාන, මාරාව, මොණරාගල.

සමාගමේ ලේකම්.

08-990

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම: සීමාසහිත (ජනතා) කිවුලේආර ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3135
3. සංස්ථාගත කළ දිනය : 2007.07.12
4 ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : කිවුලේආර, මාරාව, මොණරාගල.

සමාගමේ ලේකම්.

08-991

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

චාල්ස් ස්කල් කොළඹ 3 පදිංචි ෂහිඩුල් හිජ්රි මොහොමඩ් වන මම අංක 702/1පී මීගමු පාර, මාබෝල වත්තල පදිංචි තුවාන් අහමඩීන් යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත්කරමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අෂ්රොප් රූමී සහතික කළ අංක 2641 හා 2005 සැප්තැම්බර් මස 29 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. තවද, එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බව වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

එස්. එච්. රිෂාන්,
චාල්ස් ස්කල්.

කොළඹ 03.
08-994

## ඇටර්නි බලය අවලංගු කිරීම

පිලැස්ස, මාස්වැව, අංක 20 හි පදිංචි සරුක්කාර විදාන ආරච්චිලාගේ උපාලි වන මා විසින් අත්සන් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් රාජපක්ෂ වාසල පණ්ඩිතරත්න මුදියන්සේලාගේ ගාමිණී රාජපක්ෂ මහතා විසින් සහතික කරන ලද අංක 3205 හා 2003 සැප්තැම්බර් මස 21 වැනි දිනැති ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස වීරක්කුට්ටි බදුගේ රූපාවතී යන අය පත් කිරීම අද දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බවටත්, මින් ඉදිරියට එකී වීරක්කුට්ටි බදුගේ රූපාවතී යන අය විසින් මාගේ ඇටර්නි බලකරු ලෙස සිදු කරන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා ශ්‍රී ලංකාවේ මහජනතාවටත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

සරුක්කාර විදාන ආරච්චිලාගේ උපාලි.

08-958

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම: සීමාසහිත (ජනතා) ඌරාවුල ගැමිදිරිය සමාගම
2. සමාගමේ අංකය : පී. බී. 3148
3. සංස්ථාගත කළ දිනය : 2007.07.10
4 ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ඌරාවුල දොරකුඹුර, පදියතලාව

සමාගමේ ලේකම්.

08-979

## සමාගක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම: ඩයිකො එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය හා දිනය : පී. වී 60704 2007.07.18
ලියාපදිංචි ලිපිනය : අංක 30, වාලි මවුන්ට් ඉන්ඩස්ට්‍රියල් ස්ටේට්, වැලිහින්ද, දෙහිපිටිය.

අධ්‍යක්ෂ.

2007 ක් වූ අගෝස්තු මස 13 වැනි දින දී ය .
08-961

## දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007, අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ජේදයේ අනු ජේද 01 ට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

"සීමාසහිත සින්ජි ට්‍රාන්ස්පෝට් (පෞද්ගලික) සමාගම" සහතික අංක පී. වී. 60557 යටතේ 2007 ජුලි මස 05 දින නිත්‍යානුකූල ලෙස ලියාපදිංචි කළ අතර එහි ලියාපදිංචි කාර්යාලය බත්තරමුල්ලේ, දම්මෝදය මාවතේ අංක 1131 1/බී හි පිහිටා ඇත.

සමාගම් ලේකම්වරු සීමාසහිත වාට් බිස්නස් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම, අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

08-960/1

## දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007, අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ජේදයේ අනු ජේද 01 ට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

"සීමාසහිත ස්කයිලයින් මැරිටයිම් (පෞද්ගලික) සමාගම" සහතික අංක පී. වී. 60064 යටතේ 2007 මැයි මස 24 දින නිත්‍යානුකූල ලෙස ලියාපදිංචි කළ අතර එහි ලියාපදිංචි කර්යාලය කොළඹ 13, කේ. සිරිල් සී. පෙරේරා මාවතේ අංක 469/1 හි පිහිටා ඇත.

සමාගම් ලේකම්වරු සීමාසහිත වාට් බිස්නස් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම, අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

08-960/2

## දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ඡේදයේ අනු ඡේද 01 ට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

"සීමාසහිත කුමාරගේ රබර් ඉන්ඩස්ට්‍රීස් (පෞද්ගලික) සමාගම" සහතික අංක පී. වී. 60134 යටතේ 2007 ජූනි මස 22 දින නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි කළ අතර එහි ලියාපදිංචි කර්යාලය රත්නපුර, පොත්ගුල් විහාර මාවතේ අංක 86 ඒ හි පිහිටා ඇත.

සමාගම් ලේකම්වරු සීමාසහිත වාට් බිස්නස් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම, අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

08-960/3

---

## දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ඡේදයේ අනු ඡේද 01 ට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

"සීමාසහිත හේසෝන් ඉන්ටනැෂනල් (පෞද්ගලික) සමාගම" සහතික අංක පී. වී. 60053 යටතේ 2007 ජූනි මස 05 වැනි දින නිත්‍යානුකූල ලෙස ලියාපදිංචි කළ අතර එහි ලියාපදිංචි කර්යාලය බත්තරමුල්ලේ, පැලවත්ත, තලන්ගම කන්දෙවත්තේ අංක 673/පී II හි පිහිටා ඇත.

සමාගම් ලේකම්වරු සීමාසහිත වාට් බිස්නස් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම, අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

08-960/4

---

## දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ඡේදයේ අනු ඡේද 01 ට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

"සීමාසහිත සෙවන් වන් සෙවන් (පෞද්ගලික) සමාගම" සහතික අංක පී. වී. 60332 යටතේ 2007 ජූනි මස 20 දින නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි කළ අතර එහි ලියාපදිංචි කර්යාලය හෝකන්දර, අරන්ගල, ජයගත් මාවතේ අංක 159 ඒ හි පිහිටා ඇත.

සමාගම් ලේකම්වරු සීමාසහිත වාට් බිස්නස් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම, අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

08-960/5

---

## දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007, අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ඡේදයේ අනු ඡේද 01 ට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

"සීමාසහිත පවර් ගෑස් ලංකා (පෞද්ගලික) සමාගම" සහතික අංක පී. වී. 60681 යටතේ 2007 ජූලි මස 17 දින නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි කළ අතර එහි ලියාපදිංචි කර්යාලය නුගේගොඩ, කන්දෙවත්ත පාර, අංක 28 හි පිහිටා ඇත.

සමාගම් ලේකම්වරු සීමාසහිත වාට් බිස්නස් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම, අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

08-960/6

---

## දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ඡේදයේ අනු ඡේද 01 ට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

"සීමාසහිත ආර්. ඒ. ඩබ්ලිව්. රබර් ප්‍රොඩක්ස් (පෞද්ගලික) සමාගම" සහතික අංක පී. වී. 60049 යටතේ 2007 මැයි මස 29 දින නීත්‍යානුකූල ලෙස ලියාපදිංචි කළ අතර එහි ලියාපදිංචි කාර්යාලය බත්තරමුල්ලේ, රොබට් ගුණවර්ධන මාවතේ ලිලී ඇවනියුහි අංක 41 හි පිහිටා ඇත.

සමාගම් ලේකම්වරු සීමාසහිත වාට් බිස්නස් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම, අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

08-960/7

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) මස්ඉඹුල එකමුතු ගැමිදිරිය සමාගම,
2. සමාගමේ අංකය : පී. බී. 3105,
3. සංස්ථාගත කළ දිනය : 2007 ජූලි මස 10,
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : උඩවතුකැලය, රක්වාන.

සමාගමේ ලේකම්.

08-1075

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :

1. සමාගමේ නම : සීමාසහිත (ජනතා) මස්ඉඹුල ප්‍රගති ගැමිදිරිය සමාගම,
2. සමාගමේ අංකය : පී. බී. 3090,
3. සංස්ථාගත කළ දිනය : 2007 ජූලි මස 12,
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අලවත්තැන්න, රක්වාන.

සමාගමේ ලේකම්.

08-1076

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව කරන දැන්වීම

දියගල ටී ප්ලාන්ටේෂන් (පෞද්ගලික) සමාගම (පී. වී. 60456)

ඉහත සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව 2007 ජූනි මස 28 වැනි දින සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කළ අතර එහි ලියාපදිංචි කාර්යාලය ශ්‍රී පලාබද්දල, රත්නපුර ස්ථානයේ පිහිටා ඇත.

අකුරුටියගේ ප්‍රදීප් විමල් විජේතුංග,
අධ්‍යක්ෂ,
දියගල ටී ප්ලාන්ටේෂන් (පීවීටී) එල්ටීඩී.

2007 අගෝස්තු මස 06 වැනි දින.

08-1077

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 168/03, මාටගොං පාර, කෙරවලපිටිය, හැඳල, වත්තල හි ජේසුදාසන් පිලිප් පත්මනාදන් විසින් ශ්‍රී ලංකා ජනරජයේ අංක 63 ඊ, මල්වාන, මල්වත්ත හොන්නන්තරගේ සමන්ත ප්‍රේමලාල් ගෝමස් වෙත වර්ෂ 2004.03.10 වැනි දින ප්‍රදානය කරන ලද අංක 189, හේකිත්ත, වත්තල නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් වන පී. විජේරත්න මහතා විසින් සහතික කරන ලද අංක 527 දරන ඇටෝර්නි බලපත්‍රය 2007.08.31 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර හා බලරහිත කර ඇති බවත්, එම දිනයේ සිට මොනයම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හොන්නන්තරගේ සමන්ත ප්‍රේමලාල් තෝමස් කිසිම වගකීමක් හා බැඳීමක් නොදරන බවත්, ශ්‍රී ලංකා රජයට හා මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

ජේසුදාසන් පිලිප් පද්මනාදන්.

08-1085

---

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය අනුව පහත සඳහන් සමාගම (සංගමය) ස්ථාපිත කරන ලදී :

සංගමයේ නම : ඇසෝෂියේෂන් ෆෝ ක්ලිනිකල් බයෝකෙමිස්ට්‍රි,
සංස්ථාපිත අංකය : ජී. ඒ. 2011,
ලියාපදිංචි කළ දිනය : 2007 ජූලි මස 18 වැනි දින,
ලියාපදිංචි කළ ලිපිනය : 14 ඒ, වාල්ස් ඩ්‍රයිව්, කොළඹ 03.

ලේකම්.

08-1047

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීමයි :

(1) සමාගමේ නම - ෂැංඩොං වෙයැං ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය - පීවී 60787
ලියාපදිංචි ලිපිනය - අංක 60, වජිර පාර, කොළඹ 4
ලියාපදිංචි කළ දිනය - 2007.07.26

(2) සමාගමේ නම - මිෂන් ලොජිස්ටික්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය - පීවී 60636
ලියාපදිංචි ලිපිනය - අංක 42, ලුක්මන්ජි චතුරශ්‍රය, ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14
ලියාපදිංචි කළ දිනය - 2007.07.13

ලේකම්.

08-1036

### නිවේදනයයි

ග්ලෝබල් නෙට්වර්ක් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2007 ජුලි 18 වන දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ග්ලෝබල් නෙට්වර්ක් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : ජී වී. 60686
ලියාපදිංචි කාර්යාලය : අංක 32, හැම්ප්ඩන් ලේන්, කොළඹ 6.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලේකම්වරු

08-1102

### නිවේදනයයි

ඇග්‍රි ලංකා එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 ජුලි 04 වන දින සංස්ථාගත කරන ලද බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඇග්‍රි ලංකා එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : PV 60433

ලියාපදිංචි කාර්යාලය : ගොඩිගමුව පාර, දූනගහ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඇග්‍රි ලංකා එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලේකම්වරු

08-1086

---

කොකෝ ග්‍රීන් ඉන්ටනැෂනල් 2007 ජූනි 29 වන දින සංස්ථාගත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : කොකෝ ග්‍රීන් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 60480
ලියාපදිංචි කාර්යාලය : අංක 40/1ඒ, කනන්ත පාර, තලපත්පිටිය, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රෝලී මැනේජ්මන්ට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලේකම්වරු

08-1107

---

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## රටබීම තැබෑරුම සඳහා රේන්ද විකිණීම - 2008 මොරටුව

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2008 ජනවාරි මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 31 දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ලද ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1. 1982.08.20 දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීම් කොන්දේසිය.

2. සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. පහත දැක්වෙන ස්ථානයන්ගෙන් ලබාත හැකි නියමිත ආකෘති පත්‍ර මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ, රු. 5,000 ක මුදලක් තැන්පත් කළ බවට ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය. ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද, එම සහතිකයන්හි උපලේඛනයේ ඇතුළත්, එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම්, එම වත්කම් සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු පහක් වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය.

*(ඒ)* ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්,
*(බී)* කොළඹ 2, ස්ටේප්ලර් විදිය, සුරාබදු කාර්යාලයෙන්,
*(සී)* කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය,
*(ඩී)* කළුතර සුරාබදු මණ්ඩල කාර්යාලය,
*(ඊ)* හලාවත සුරාබදු මණ්ඩල කාර්යාලය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුලත් කවරයේ උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය. "2008 වර්ෂයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 9 දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි." ටෙන්ඩර් පත්‍ර 2007.09.19 දින පෙ. ව. 10.30 ට පෙර ලැබෙන සේ මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට එවිය යුතුය.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසන් වේලාවේ දී, මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ. මොහොතේ ම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, නියම කරනු ලබන මුදල තැන්පත් ඇප මුදල වශයෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට ගෙවිය යුතුය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට, ඔහුගේ ටෙන්ඩර් පත්‍රය, පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කාලයේ දී තැන්පත් කිරීම හෝ පැහැ හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවකු වශයෙන්, සුරාබදු බලපත්‍ර කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසි හේතුවක් නොදක්වාම එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්තුමාට ඇත.

07. මෙම විදේශ මත්පැන් තැබෑරුම්, කොට්ඨාශ අංක 9 හි පවත්වාගෙන යා යුතුය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් කොට්ඨාශය තුළත් සුදුසු ගෙඩනැගිල්ලක් සපයා ගතයුතු අතර, එකී ගොඩනැගිල්ල සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැදී නොමැති බැව් සැලකිය යුතුය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ.

(ඒ)

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය ප්‍රදේශය තැබෑරුම අයත් වියයුතු පෙදෙස* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල්* | *ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව* | *විකිණීම කරන දිනය* |
|---|---|---|---|---|---|---|---|
| 1 | අංක 9 කොට්ඨාසය මොරටුව මහ නගර සභාව | මොරටුව මහ නගර සභාවේ අංක 9 කොට්ඨාසයේ ගාලු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ. ව. 11.00 ප. ව. 5.00 | ප. ව. 2.00 ප. ව. 8.00 | 5,000 | පෙ. ව. 10.30 | 2007 සැප්තැම්බර් 19 |

09. වැඩි විස්තර මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

10. *වැදගත්.*– 2007.09.19 වැනි දින විකිණීමට නොහැකි විදේශීය මත්පැන් රේන්ද 2007.10.17 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

බී. කේ. සෝමපාල,
ප්‍රාදේශීය ලේකම් මොරටුව.

මොරටුව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-886

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - මාදම්පේ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයීය බල සීමාවට අයත් මාදම්පේ ඌරලියාගාර පිහිටි ඇහැටුගහහේන නමැති විශාලත්වය අක්කර 01 රූඩ් 01 පර්චස් 18 ක ඉඩම සහ වර්ග අඩි 6,000වන තෙමහල් නිවස මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.09.19 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 1998.02.13 දින ද, "ඩේලිනිව්ස් ", "දිනමිණ" සහ "තිනකරන්" පුවත්පත්වල 1998.01.17 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– මාදම්පේ සිට ගලහිටියාව පාරේ යන විට මාදම්පේ නාගරික සීමා දැන්වීම් පුවරුව පසු කරනවාත් සමගම පාරේ වම් පැත්තෙන් වත්ත ඇතුලට පිහිටි තෙමහල් නිවස සහිත ඉඩම වේ. ගේට්ටුව අසල මුර කුටියක් ද වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. වෙන්දේසිකරුගේ ගාස්තු සඳහා 2 1/2%ක්,
3. රජයට ගෙවිය යුතු බද්ද සඳහා 1%ක් ද, වෙන්දේසි වියදම් සහ අනෙකුත් සියලු වියදම් වෙයි.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මාදම්පේ මහජන බැංකුවේ තැන්පත් කළ යුතුය.

දේපල හා ඔප්පු පරික්ෂා කිරිම සඳහා 032-2247670න් මාදම්පේ කළමණාකාර අමතන්න. වැඩි විස්තර සඳහා මහජන බැංකුවේ හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයෙන් විමසන්න.

දුරකථන අංක : 032-2253300, 2253301 ෆැක්ස් අංකය: 032-2255247

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු/තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.
දුරකථන අංකය : 031-2223219

08-1049/1

## මහජන බැංකුව - කොච්චිකඩේ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ. ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ අලුත්කුරු කෝරලේ කෝන්ගොඩමුල්ල යන ගමේ පිහිටි ඩබ්. විතාරණ මානක තැන 2000.03.07 දින අංක 3696 දරන සැලැස්මේ සඳහන් වී ඇති කොස්ගහවත්ත නමැති ඉඩමේ කොටස් අංක ඒ සහ එෆ් දරන (රූ. 01, පර්. 33.80) දරන ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේත් (ඊ 732/270 මීගමු ලියාපදිංචි කාර්යාලයේ ලේඛන ගත වී ඇති) යන දේපල විශාලත්වය රූඩ් 01 පර්චස් 33.80 මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ ම විසින් 2007.09.24 දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2006.11.29 වැනි දින දිනමිණ සහ ඩේලි නිව්ස් පුවත් පත් ද 2006.12.06 *ගැසට් පත්‍රය* ද බලන්න.

*දේපලට පිවිසීම.*– මීගම නගරයේ සිට මීරිගම පාරේ 3 1/2 කි. මී. ගියවිට හමුවන **"Y"** හන්දියෙන් දකුණට හැරී දිවුලපිටිය පාරේ 7.5 කි. මී. ගිය විට ශාන්ත අන්තෝනි මාවත හමු වේ. එය වම්පසින් පිහිටා ඇත. එතැනින් ශාන්ත අන්තෝනි පල්ලිය පිටුපසින් හැරී ජුබිලි මාවතේ 1.25 කි. මී. ගොස් පළමු පටුමගට හැරුණු විට මෙම දේපල හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
3. රජයට ගෙවිය යුතු බද්ද සඳහා 1%ක් ද,
4. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
5. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මහජන බැංකුව කොච්චිකඩේ ශාඛාවේ තැන්පත් කළ යුතුය.

දුරකථන අංක : 032-2253300/032-2253301
ෆැක්ස් අංකය : 032-2255247

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
වෙන්දේසිකරු/තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.
දුරකථන අංක: 031-2223219
031-2277518

08-1049/2

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැන්වීම

ගිණුම් අංකය : 0001 1004 2647 - දොරලහේන ටී ෆැක්ටරි

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ, 1999 දෙසැම්බර් 30 වැනි දින සම්මත කරගන්නා ලදුව, 2000 පෙබරවාරි 03 වැනි දින දරන *ගැසට් පත්‍රයෙන්* සහ 2000 අප්‍රේල් මස 28 වැනි දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකරන්" යන දිනපතා පුවත්පත්වල ද පළ කරන ලද යෝජනා සම්මතය ප්‍රකාර රුපියල් විසිලක්ෂ හැත්තෑඑක්දහස් හයසිය පනස් නවයකුත් ශත අනූ එකක් (රු. 20,71,659.91) පමණක් වූ මුදල සහ 1999.11.01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් පන්ලක්ෂ දසදහසක් (රු. 5,10,000) සඳහා වර්ෂයකට 11% බැගින්, රුපියල් අටලක්ෂ හැටහයදහස් හයසියයක් (රු. 8,66,600) සඳහා වර්ෂයකට සියයට 19.5% බැගින් සහ රුපියල් තුන්ලක්ෂ විස්එක්දහස් නවසියයක් (රු. 3,21,900) සඳහා වර්ෂයකට සියයට 19.5% බැගින් පොලිය ද ප්‍රචාරක ගාස්තු හා වෙනත් ගාස්තු ද යන මුදල් ප්‍රමාණ. ඉන් පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ විස්තර කොට තිබෙන දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් 2007.09.27 වැනි දින ප. ව. 1.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ඇතුළත අක්මීමන, තල්ගස්යායේ පිහිටි බඩහැලයාමුල්ලේ කන්ද නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් මැන සාදන ලද අංක 1161 හා 1980.12.04 දින දරන පිඹුරේ "ඒ" යනුවෙන් සළකුණු කළ බිම් කට්ටිය වන උතුරු, නැගෙනහිරට දොරලහේන කන්ද ද, *දකුණු - නැගෙනහිරට* බඩහැලයාමුල්ලේ කන්ද *නොහොත්* ඇටඹගහකන්ද ද, *දකුණු - බස්නාහිරට* මෙම ඉඩමේ ලොට් බී සහ සී දරන කට්ටි ද, *උතුරු - බස්නාහිරට* දොරලහේන සහ පාර ද යන මායිම් ඇතුළත රූඩ් තුනකුත් පර්චස් තිස්නවයක් (අ. 0, රූ. 3, පර්. 39) විශාලත්වය ඇති සහ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 141/72 යටතේ ලියාපදිංචි වී තිබෙන ඉඩම සහ එහි සවිකර තිබෙන හා මතුවට සවිකරනු ලබන යන්ත්‍රසූත්‍ර ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්

08-1093/3

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැන්වීම

ගිණුම් අංකය : 0015 5001 0867 – සුසිර රණවීර

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.11.25 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ වන දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2006.01.06 වන දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත් වලද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහතුන් ලක්ෂ අනූතුන් දහස් හත්සියතිස් හතකුත් ශත හැත්තෑවක (රු. 1,393,737.70) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් දහතුන් ලක්ෂයක රු. 1,300,000 මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම නවයක් (12.9%) බැගින් 2004 ජනවාරි මස 14 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග, ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2007.09.25 දින ප.ව. 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ උවාරගල ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත උවාරගල ග්‍රාමයේ පිහිටි පොල්ගස්තැන්නේහේන නමැති ඉඩමෙන් මිනුම්පති විසින් සාදන ලද 1957 නොවැම්බර් මස 30 දාතම හා අංක එෆ්. වී. පී 11 දරන පිඹුරේ නිරූපිත ලොට් 36 ලෙස ලකුණු කොට දක්වා ඇති, උතුරට ලොට් 1 ජී සහ වී පී 398800 ද, නැගෙනහිරට හොරගල ගමේ මායිම් ද, දකුණට ඩීආර් 3873 සහ පාරක් සඳහා වෙන්කල කොටස සහ ඩීආර් 3873 ද, සහ බටහිරට ලොට් 48 ද මායිම් වන, කොටපොල ඉඩම් කාර්යාලයේ එල්. ඩී. ඕ. ලේඛනයන් හි 5341 යොමුව යටතේ ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් අක්කර පහලොවයි, රූඩ් දෙකයි, පර්චස් හයක් (අක්. 15, රූඩ් 2 පර්. 6)වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ ඉඩම් කොටස එහි ඇති පස, ගහ කොළ, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියළු දේ සමගය.

ඉහත කී එෆ්. වී. පී. 11 හි ලොට් අංක 36 ප්‍රතිමිණුවක් වන අතර දැනට බලයලත් මිනින්දෝරු අයි. කොට්ටම්බගේ විසින් සාදන ලද 2000.06.06 දාතම හා අංක 168/00 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 36 වශයෙන් ලකුණු කොට දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-1093/1

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැන්වීම

ගිණුම් අංකය : 0020 5000 7521 ඩී. එස්. පී. ප්‍රේමසිරි

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.11.25 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2005.12.09 වන දින *රජයේ ගැසට් පත්‍රයේ ද*, 2005.11.28 වැනි දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" යන දිනපතා පුවත්පත් වලද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දසලක්ෂ පනස්දහස් දෙසිය අසූ දෙකකුත් ශත හතලිස් එකක (රු. 1,050,282.41 පමණයි) මුදල සමග තවත් රුපියල් නම ලක්ෂ හත්දහස් හයසියයක (රු. 907,600ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහහතයි දශම පහ (17.5%) බැගින් 2004 අගෝස්තු මස 08 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද, සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2007.09.18 දින පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

#### ඉහත කී උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුලුගම් - පනාවැල් දෙ කෝරලයන්හි, පනාවැල් කෝරලේ බටහිර අස්ගගුල මහවත්ත *නොහොත්* කොළඹ වෙදගේ හිටපු මහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඒ. සෝමරත්න විසින් සාදන ලද 1980 අප්‍රේල් මස 11 දාතම හ අංක 1279 පිඹුරේ නිරූපිත ලොට් 5 ඒ වශයෙන් ලකුණු කොට දක්වා ඇති (එම මිනින්දෝරු තැන විසින් ම සාදන ලද 1971 ජුලි 30 සහ 1971 සැප්තැම්බර් මස 10 දාතම හ අංක 374 දරන පිඹුරේ ලොට් 5 සහ 6 හි උපබෙදුමක් වන) උතුරට අංක 374 පිඹුරේ පාරට වෙන් කළ කොටස වන ලොට් 6 ද, නැගෙනහිරට අංක 1279 පිඹුරේ ලොට් 5 බී ද, දකුණට සම්මුන් ලෙබ්බේ සහ තවත් අයට අයත් මීගහවත්ත ද සහ බටහිරට අංක 374 පිඹුරේ ලොට් 2 ද, මායිම් වන අවිස්සාවේල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙලුම/පත්ඉරුව 73/146 හි ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් පර්චස් විසිපහයි දශම දෙකයි පහක් (අක්. 0 රූඩ් 0 පර්. 25.25) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි ඇති උළු වහල සහිත නිවස, ගරාජය සහ වැසිකිලි හා අනෙක් සෑම සියලු දේ සමග සහ බලයලත් මිනින්දෝරු එම්. ඒ. සෝමරත්න විසින් සාදන ලද 1971 ජුලි 30 සහ 1971 සැප්තැම්බර් 30 දාතම හා අංක 374 දරන පිඹුරේ ලොට් 6 මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද හා සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගමේ ලේකම්.

08-1093/2

## නේෂන් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ කෙරෙන වෙන්දේසියයි

#### ප්‍රසිද්ධ දේපල වෙන්දේසිය ඉතාමත් වටිනා දේපල

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දයේන්ද්‍ර සමරසිංහ විසින් ලියා සහතික කරන ලද 1997.03.05 දිනැති අංක 2260 සහ වර්ෂ 2001.02.19 දිනැති අංක 2655 සහ 2001.02.19 අංක 2657 දරන උකස්කර මත නුගේගොඩ, ඩී. එස්. ජයසිංහ මාවතේ අංක 27 දරන ස්ථානයේ පදිංචි යුනිවර්සල් වර්ක්ස් (ටෙක්ස්ටයිල්ස්) ව්‍යාපෘතිය නාමය හා විලාශය යටතේ එකම හිමිකරු වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන විදානගමච්චිගේ නලින් ශානක රණවිර යන අය විසින් ඉහත කී බැංකුවට උකස් කරන ලද පහත සඳහන් දේපල

(1) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුල කුරුඳුවත්තේ වෝඩ් පෙදෙසෙහි මීට පෙර වරිපනම් අංක 24/5 වෝඩ් පෙදෙස, දැනට වරිපනම් අංක 12 සුබස්ථාන් ගාඩ්න්ස් දරන බලයලත් මිනින්දෝරු එච්. දොන් ඩේවිඩ් විසින් මැන සාදන ලද අංක 2050 හා 1935 පෙබරවාරි 22 වන දිනය දරන පිඹුරේ පෙන්නුම් කර තිබෙන ලොට් අංක 06 වශයෙන් සලකුණු කරන ලද ගුඩ්වුඩ් නැමති බෙදා වෙන් කල ඉඩම් කැබැල්ලට මායිම් උතුරට එකී අංක 2050 දරන සැලැස්මේ ලොට් අංක 7 දරන බිම් කැබැල්ලද, නැගෙනහිරට වෝඩ් පෙදෙසේ වරිපනම් අංක 30 විල්ටන් ද, දකුණට රොස්මීඩ් පෙදෙසේ වරිපනම් අංක 41 දරන ශ්‍රී වියල්ස් ද සහ බස්නාහිරට කැබලි අංක 5 සහ අඩි 20 ක් පළලැති පාරද, යන මෙකී මායිම් තුල අංක 2050 දරන එකී සැලැස්මේ ප්‍රකාර පර්චස් තිස් හතරයි දශම සීයෙන් අනූපහ (අ.0, රූ. 0, පර්.34, 95/100) ක් කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 757/106 යටතේ ලියාපදිංචි කරන ලදී.

සහ, සෑම අවස්ථාවකම පයින් හෝ වෙනත් අන්දමින් දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී සඳහටම යාම්ඊම් කිරීමේ අවසරය හා බලයද, අශ්වයින්, හරක් හෝ වෙනත් සතුන් ගෙන යාමේ අයිතියද මෝටර් රථ, ලොරි බඩු පටවාගෙන හෝ බඩු රහිතව එකී මාර්ගයේ එහා මෙහා ගමන් කිරීමේ අයිතියද, කැලිකසළ කාණු සහ ජලනල සවිකිරීමටද, ඉඩම් තුලින් විදුලි බලය සඳහා උඩින් වයර් ඇදීමද, කැළිකසල බැස්සවීම සඳහා නල සවිකිරීමටද සහ වෙනත් අවශ්‍ය දේ සවි කිරීමටද අවසර ඇතිවද, ඉහත කී කුරුඳුවත්තේ වෝඩ් පෙදෙසේ අංක 2050 දරන එකී සැලැස්මේ දක්වා ඇති (අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද බිම් තීරය) බෙදා වෙන් කළ බිම් කැබැල්ලට මායිම්, උතුරට වෝඩ් පෙදෙසද, නැගෙනහිරට විලාගිරන්ස් ද, දකුණට එකී අංක 2050 දරන සැලැස්මේ කැබැලි අංක 5 සහ 4 ද, බස්නාහිරට එකී අංක 2050 දරන සැලැස්මේ අංක 1, 2, සහ 3 දරන බිම් කැබලි ද, යන මෙකී මායිම් තුල එකී අංක 2050 දරන සැලැස්මේ ප්‍රකාර බිම් ප්‍රමාණයෙන් පර්චස් තිස් දෙකයි දශම සීයයෙන් තිස් හයක්(අ.0. රූ. 0, පර්. 32 36/100) සහ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 734/259 යටතේ ලියාපදිංචි කරන ලදී.

(2) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ නගර සභා සීමාව තුල පිටකෝට්ටේ පිහිටි පාගොඩ පාරේ පිහිටි වරිපනම් අංක 139 හා 139/ඒ දරන කොටනුවේවත්ත කියන ටී. ඩී. ඩබ්. ජී. පෙරේරා අවසරලත් මිනින්දෝරු විසින් 1987 ජුනි මස 28 දිනැති අංක 718 දරන සැලැස්මේ දක්වා ඇති කැබලි අංක 1 සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද එකී අංක 1 දරන බිම්කැබැල්ලට මායිම්, උතුරට අංක 143/3 සහ 143/4 පාගොඩ පාරද, නැගෙනහිරට පාගොඩ පාරේ වරිපනම් අංක. 141 දරන ස්ථානය ද, දකුණට පාගොඩ පාරද, සහ බස්නාහිරට පොදු අඩි පාරද, සහ බිම් කාණුවද යන මෙකී මායිම් තුල එකී අංක 718 සැලැස්මේ ප්‍රකාර බිම් ප්‍රමාණය රූඩ් එකයි පර්චස් විසිහයයි දශම නවයයි බිංදුව (අ.0, රූ. 1,පර්. 26.90) ක් සහ ගල්කිස්සේ ඉඩම් ලියාපදිංචි

කිරීමේ කාර්යාලයේ එම් 1746/238 යටතේ ලියාපදිංචි කරන ලදී.

(3) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුල වැල්ලවත්ත දැනට ඩබලිව්.ඒ.සිල්වා මාවතේ පිහිටි මීට පෙර පාමංකඩ පාරේ පසු කලෙක මහවීදිය යයි කියන ලද කලින් වරිපනම් අංක 434, 435, සහ 436 දරන වශයෙන් ද පසු කලෙක අංක 62, 64 සහ 66 වශයෙන් දැනට අංක 62 දරන එකී බිම් කැබලි සහ එහි තිබෙන්නා වූ ගොඩනැගිලි සහ සියලු දේ ද වේ.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුල වැල්ලවත්තේ ඩබ්ලිව්. ඒ ද සිල්වා මාවතේ පිහිටි ලියාපදිංචි අංක 2 සැලැස්මේ 205 දරන බිම් කට්ටියේ ඉඩමට මායිම් උතුරට පාර ද, නැගෙනහිරට 204 දරන බිම් කට්ටිය ද, දකුණට 206 දරන බිම් කට්ටිය ද, සහ බස්නාහිරට 205 ඒ බිම් කට්ටිය ද, යන මෙකී මායිම් තුළ බිම් ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දහයයි සීයෙන් හැට (අ.0, රූ. 1, පර්. 10, 60/100) පංගුවක් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල්ලවත්ත කොට්ඨාසයේ 154/252 හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී වැල්ලවත්ත ඩබ්. ඒ. සිල්වා මාවත දිගේ අංක 2 ලියාපදිංචි සැලැස්මේ 204 බිම් කැබැල්ලට මායිම්, උතුරට පාර ද, නැගෙනහිරට 201 බිම් කැබැල්ල ද, දකුණට 206 දරන බිම් කැබැල්ල ද, බස්නාහිරට 205 බිම් කැබැල්ල ද, යන මෙකී මායිම් තුළ බිම් ප්‍රමාණය පර්චස් අටයි සියයෙන් විසිපහ (අ. 0 රූ. 0 පර්. 8 25/100)ක් වේ. මෙම ඉඩම වැල්ලවත්ත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ 148/28 හි ලියාපදිංචි වී ඇත.

නේෂන් ට්‍රස්ට් බැංකුවේ මා වෙත පවරා ඇති බලය මත 2007 සැප්තැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා පෙ.ව. 10.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රම.–* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසියේ තීන්දු කළ විගස පහත සඳහන් කළ ගෙවීම් මුදලින් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහය (ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව සහ ගැනුම් මිල මත අයවිය යුතු අනෙකුත් සියලු බදු සමග) වෙන්දේසියේ දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය,
2. ගැනුම් මිලෙන් සියයට එකක් ප්‍රාදේශීය සභා බදු ලෙස අදාල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය,
3. ගැනුම් මිලෙන් සියයට 2.5 ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය,
4. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරක සහ අනෙකුත් වියදම්,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් 500 යි,
6. නොතාරිස් ගාස්තු විකිණීම වෙන්දේසි සහතික කිරීම සඳහා

හිමිකම් ඔප්පු සහ වෙනත් ලියවිලි කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 242 දරන ස්ථානයේ නේෂන් ට්‍රස්ට් බැංකුවේ දී පරීක්ෂා කර බැලිය හැක.
දුරකථන අංකය : 4313158

එන්. ඩී. ඩී. පී. සේනානායක,
ට්‍රියැඩ් ඔක්ෂනියර්ස්,

අංක 155/1, දෙහිවලපාර,
බෙල්ලන්විල.
දුරකථන අංකය :-2730962, 2731317

08-1074

## ඩී. එෆ්. සී. සී. බැංකුව (පෙර ලංකා සංවර්ධන මුදල් සංස්ථාව)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ වෙන්දේසි කිරීමයි

අංක 3606, 3730, 3913, 3994, සහ 4007 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තර 1. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් හතර හා මහනගර සභා සීමා ඇතුළත කොටුවේගොඩ පිහිටි ගුණවර්ධන මාවත වරිපනම් අංක 178/1 දරන කෝවිල්වත්ත, හතරෙන් තුන් පංගු කොටසට ලොට් "ඒ" නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රෂ්මි විසින් මැන සාදන ලද අංක. 864 හා 1999.06.02 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් "ඒ3" ලෙස සලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය. මෙම ඉඩමේ බිම ද එහි පිහිටි සියලු වැව්ලි සහ ගොඩනැගිලි ද එහි ඉදිකරනු ලබන පිරියත හා යන්ත්‍රසූත්‍ර සහිත ගොඩනැගිලි ද ඒවායේ ස්ථිරව සවිකරනු ලබන පිරියත හා යන්ත්‍රසූත්‍ර ද වේ.

ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 5.625 පර්චස් පහයි දශම හයයි දෙකයි පහයි.

2. ඉහත කී කොටුවේගොඩ පිහිටි ගුණවර්ධන මාවත වරිපනම් අංක 178/1 දරන කෝවිල්වත්ත, හතරෙන් තුන් පංගු කොටස ලොට් "ඒ" නැමැති ඉඩමේ ඉහත සඳහන් අංක 864 දරන පිඹුරේ දැක්වෙන ලොට් "ඒ4" ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය. මෙම ඉඩමේ බිම ද එහි පිහිටි සියලු වැව්ලි සහ ගොඩනැගිලි සහ එහි ඉදිකරනු ලබන ගොඩනැගිලි ද ඒවායේ ස්ථිරව සවිකරනු ලබන පිරියත හා යන්ත්‍රසූත්‍ර ද වේ.

ප්‍රමාණය : අ. 0. රූ. 0, පර්. 21.450
පර්චස් විසි එකයි දශම හතරයි පහයි බිංදුව

අංක 3729, 3995 සහ 4008 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තරය

1. දකුණු පලාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් හතර හා මාතර නගර සභා සීමාව ඇතුළත කොටුවේගොඩ පිහිටි ගුණවර්ධන මාවත, වරිපනම් අංක 174 දරන කෝවිල්වත්ත බෙදා වෙන්කළ බස්නාහිර පැත්තේ හතරෙන් එක් පංගු කොටස නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එල්. එම්. රෂ්මි විසින් මැන සාදන ලද අංක 1254 හා 2001.04.09 වන දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය. එහි තුළ පිහිටි බිම සහ එහි පිහිටි සියලු දේ සමග වේ.

ප්‍රමාණය : අ. 0, රූ. 0 පර්. 4.382
පර්චස් හතරයි දශම තුනයි අටයි දෙක.

2. දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ,මාතර කඩවත් සතර හා මාතර නගර සභා සීමාව ඇතුළත කොටුවේ ගොඩ පිහිටි පරණ මාර්කට් පාර වරිපනම් අංක 59/1 දරන වසුන්දරාවත්තේ බෙදා වෙන්කළ ලොට් "බී" සහ "සී" දරන බිම් කට්ටිවල ලොට් අංක 3 *නොහොත්* වසුන්දරාවත්තේ බස්නාහිර තුනෙන් පංගු දෙකේ කොටස සහ නැගෙනහිර තුනෙන් පංගු කොටස නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. දහනායක විසින් මැන සාදන ලද අංක 347 ඒ සහ 1999.09.04 දින දරන මාතර දිසා අධිකරණයේ අංක පී/10856 දරන බෙදුම් නඩුවට ගොනු කර තිබෙන බෙදුම් පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස සලකුණු කළ බෙදා වෙන් කරන ලද බිම් කොටස, මෙම ඉඩමේ බිම සහ එහි තුළ පිහිටි සියළු දේ සමග වේ.

ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 5.704
පර්චස් පහයි දශම හතයි බිංදුවයි හතර

3. ඉහත කී කොටුවේගොඩ පිහිටි පරණ මාර්කට් පාර වරිපනම් අංක 59/1 දරන වසුන්දරාවත්තේ බෙදා වෙන් කළ ලොට් "බී" සහ "සී" දරන කට්ටිවල ලොට් අංක 3 *නොහොත්* වසුන්දරාවත්තේ බස්නාහිර තුනෙන් පංගු දෙකේ කොටස සහ නැගෙනහිර තුනෙන් පංගු කොටස නැමැති ඉඩමේ ඉහත සඳහන් කළ අංක 347/ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය මෙම බිමේ බිම සහ එහි පිහිටි සියලු දේ සමග වේ.

ප්‍රමාණය : අං. 0, රූ. 0, පර්. 1.901
පර්චස් එකයි දශම නවයයි බිංදුවයි එක.

අංක 4008 සහ 3995 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තර

ඉහත කී කොටුවේගොඩ පිහිටි පරණ මාර්කට් පාර වරිපනම් අංක 59/1 දරන වසුන්දරාවත්තේ බෙදා වෙන් කළ ලොට් "බී" සහ "සී" දරන කට්ටිවල ලොට් අංක 3 *නොහොත්* වසුන්දරාවත්තේ බස්නාහිර තුනෙන් පංගු දෙකේ කොටස සහ නැගෙනහිර තුනෙන් පංගු කොටස නැමැති ඉඩමේ ඉහත සඳහන් අංක 347/ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 3 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය මෙම ඉඩමේ බිම සහ එහි පිහිටි සියළු දේ සමග වේ.

ප්‍රමාණය : අ. 0 රූ. 0, පර්. 3.802
පර්චස් තුනයි දශම අටයි බිංදුවයි දෙක

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එල්.වී ද සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 3606 හා 2000.11.22 දින, 3729 හා 2001.07.19 දින, 3730 හා 2000.07.19 දින, 3913 හා 2002.10.25 දින, 3995 හා 2003.06.11 දින, 4008 හා 2003.07.17 දින, 3994 හා 2003.06.11 දින, 4007 හා 2003.07.17 දින දරන බැඳුම්කර මත ඩී.එෆ්.සී.සී බැංකුවට, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි කාර්යාලය කළුතර පිහිටවා ඇත්තා වූ ද, සමාගමක් වන දේශානි ඩ්‍රෙස් පොයින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් නැමැති සමාගම, ඉහත උකස් බැඳුම්කර මගින් උකස් කර ඇති ඉහතින් විස්තර කර ඇති ඉඩම්, පරිශ්‍ර සහ ගොඩනැගිලි ඩී. එෆ්. සී. සී. බැංකුව මගින් මා වෙත පවරන ලද බලතල අනුව වර්ෂ 2007 ක් වූ සැප්තැම්බර් මස 21 වෙනි දින ප.ව. 2.00 ආරම්භකර එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* : විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීමේ වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%)
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
4. නොතාරිස් ගාස්තු රු. 2000
5. ලිපිකරු හා සෝෂක වේතනය රු.500
6. සියළුම ප්‍රචාරක වියදම්
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හා වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බද්ධ තීරු බද්ද හෝ වෙනත් බදු ගෙවීම් නිකුත්කළ දින සිට දින 30 ක් ඇතුළත දී ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති නිලධාරී අමතන්න.

දුරකථන අංකය : 011-2442442.

ගාමිණී බී. එස්. දියාව
වෙන්දේසිකරු තක්සේරුකරු සහ බ්‍රෝකර්වරු

247. ප්‍රීතිපුර පාර,
පල්ලිය වත්ත, හැඳල,
වත්තල

දුරකථන අංක : 011-2949010, 0777281723

08-1104